# සුභාෂිතයෙන්.......

පරසිදු පුබු දනන් සෙව් පමනින්　　　මහරු
බෙලෙනුදු මඳ වුවත් නොකෙරති රුපුන්　　සරු
බරනිඳු ගෙලෙ වසන නා රද වෙමින්　　　ගරු
ගුරුලිඳු අතින් ඇසි කිම යහලු　　　තොරතුරු

**ගැදි පැදිය:-**
මහරු පරසිදු
පබු දනන්
සෙව් පමනින්
බෙලෙනුදු මඳ උවත්
(සමහරු) රුපුන් රුස නොකෙරෙති
බරනිඳු ගෙලෙ වසන
නා රද
ගරු වෙමින්
යහලු තොරතුරු කිම(යි)
ගුරුලිඳු අතින් ඇසි

**තේරුම:**
(මහරු) රටුන්ගෙන් ගරු බුහුමන් ලබන, (පරසිදු) රටේ නම ගිය /ප්‍රසිද්ද, (සෙව් පමනින්) ඇසුරු කල පමනින්, (බෙලෙනුදු මඳ උවත්) බලයෙන් හීන උනත් / කොතරම් දුබලයන් උනත්, (රුපුන් සරු නොකෙරති) සතුරන්ට ගර් සරු නොකරති/ 'කෙයාර්' නොකරති, (එය හරියට), (බරනිඳු ගෙලෙ වසන) ඊශ්වරයාගේ බෙල්ලේ දැවටී සිටින, (නා රද) නාග රාජයා, (ගරුවෙමින්) උඩඟු වී/ හිස උදුම්මා ගෙන, (යහලු තොරතුරු කිම) යාලුවා ඔයාගේ සැප දුක් කෙසේ ද (කියා), (ගුරුලිඳු අතින් ඇසි) ගුරුලු රාජයාගෙන් ඇසීය (ඇසීම වැනි ය.)

'නාරද' සහ 'නා-රද' කියවිය යුත්තේ දෙ විදියකට ය. 'නාරද' යන්නෙන් 'රද' සංවෘත හඬින් ('කරන' කියවන විදියට) කියවිය යුතු අතර, 'නා-රද' යන්නෙන් 'රද' -රද" විවෘතවත් 'ද' සංවෘතවත් (රල/ කද කියවන විදියට ) කියවිය යුතු ය.

**පැහදීම**

පරසිදු: (ප්‍රසිද්ධ) කතා බහේ දී ප්‍රසිද්ද / පරසිද්ද යනුවෙනුත්, ලියන බසේ දී පසිදු-පරසිදු / පසිඳු -පරසිඳු යනුවෙනුත් වියහාර වේ.
පබු: (ප්‍රභූ) පැදි බසේ වියහාර වන මේ වචනය ගැදි බසේ ව්‍යාහාර වන්නේ ඉතා අඩුවෙනි.
සෙව්: සේවනය කල/ ඇසුරු කල,
බෙලෙනුදු: (බල එන් දු) බල එන් = බෙලෙන්, බලෙන් යන්න ආදේශ විදියෙන් බෙලෙන් වේ. (තෙනෙන්, කෙමෙන්, දෙලෙන්, නෙලෙන්, පෙදෙන් වැනි පද මෙනි) බෙලෙන් දු = බෙලෙනුදු / බෙලෙනුත් (දැන් දු = දැනුදු / දැනුත්, ඇසින් දු = ඇසිනුදු / ඇසිනුත් වැනි පද මෙනි)

රුපුන් සරු නොකෙරෙති: විරුද්ධකාරයන් ගැන තැකීමක් නැත. ඔවින් ගනන් ගන්නේ නැත.
බරනිඳු: (බරන ඉඳු) බරන යනු නයා ය. බරනිඳු යනු මෙහෙසුරා ය.
ගුරු ලිඳු: ගුරුලා මනඃකල්පිත පක්සියෙකැය්ද කියති. ඌ විශ්නු දෙවියන් ගේ වාහනය ලු. ගුරුලු රාජයා / (පත/දඬු) මහා ගුරුලා ය. 'බරනිඳු' යන්නේත් 'ගුරුලිඳු' යන්නේත් ඇත්තේ එකිනෙකට නො සැසඳෙන තේරුම් දෙකකි. බරනඉඳු බරනිදු = මෙහෙසුරා ගුරුලු ඉඳු ගුරුලිදු = ගුරුලු රාජයා (විශ්නු නොවේ) බර නෙත් (දෙලොස් ඇස්) බරනෙත් = ස්කන්ධ කුමාරයා. 'රුපුන් සරු නොකෙරෙති' යන්න වැකියක් වීම සඳහා අවශ්‍ය ම අංගය වු උක්තක් එහි නැත. අපි එතැනට 'දුබලයෝ ද' හෝ 'සමහරු' වැනි උක්තයක් යොද අදහස තේරුම් ගනිමු.

පසු ගිය ලිපියක මා දැක්වූ කරුනක ඇති ගැටයක් ගැන දෙ තුන් දෙනෙකු ම විමසීම නිසා ඒ ගැටය ලිහා දීම මැනවැය් සිතමි.

"ආඛ්‍යාතය වෙනුවට ඇත/ඇති හෝ නැත/නැති යන පදයක් ඇති වාක්‍යයක කර්තෘ පදය උක්ත විය යුතු බව" වියරන පොත්වල සඳහන් වේ. ඒ අනුව,

- ★ මේ පාසලේ මුල් ගුරුවරයෙක් නැත.
- ★ අද්‍යක්ශ මන්ඩලයේ කාන්තාවෝ දෙදෙනෙක් ද ඇත.
- ★ හාමුදුරුවෝ අද පන්සලේ නැත.
- ★ දැන් අපට අවංක නායකයෙක් ඇත.

යන වාක්‍ය හතරේ ඇති ගුරුවරයෙක්, කාන්තාවෝ දෙදෙනෙ-ක්, හාමුදුරුවෝ, නායකයෙක් යන කර්තෘ පද උක්ත රූපයෙන් තබා ඇත.

ඒ එසේ උවත්, පූර්ව ක්‍රියා පදයක් හෝ භාව ක්‍රියා පදයක් සමඟ ඇත/ඇති හෝ නැත/නැති යන පදයක් යොදන විට කර්තෘ අනුක්ත රූපයෙන් තැබිය යුතු බව ද ඒ පොත්වල සඳහන් වේ. අනුව,

- ★ මේ පාසලට සංගිත ගුරුවරයෙකු ලැබී නැත.
- ★ මා කුරානය කියවා නැත.
- ★ දැරියක ගඟට බිලි වී ඇත.
- ★ නායක හාමුදුරුවන් අපේ දානයට පැමින නැත.
- ★ ඇමතියන් කීප දෙනෙකු ම අද රැස්වීම අමතනු ඇත.
- ★ නායක හාමුදුරුවන් ද අපේ දානයට පැමිනෙනු ඇත.

යන වාක්‍ය හයේ ඇති ගුරුවරයෙකු (ලැබී ) (නැත), මා (කියවා) (නැත), දැරියක (බිලි වී) (ඇත), හාමුදුරුවන් (පැමින) (නැත), ඇමතියන් කීප දෙනෙකු (අමතනු) (ඇත), හාමුදුරුවන් (පැමිනෙනු) (ඇත) යන පදවල කර්තෘ අනුක්ත රූපයෙන් තබා ඇත.

අප්‍රානවාචී නාම පදයක් උක්ත වි ඇති වාක්‍යයක ආඛ්‍යාතය වෙනුවට ඇත/ඇති හෝ නැත/නැති යන පද මෙන් ම 'තිබේ' යන පදයද යෙදිය හැකි ය.

- ★ සීයාගේ කකුලක්/කකුල් ඉදිමී ඇත/නැත/තිබේ.
- ★ මේ සතාට කකුල් ඇත/නැත/තිබේ.
- ★ අපේ අඹ ගස පීදී ඇත/නැත/තිබේ.

යන වාක්‍ය තුන තේරුම් ගන්න. 'ඇත' වෙනුවට 'තිබේ' යෙදුනත් 'නැත' වෙනුවට 'නොතිබේ' යෙදෙන තැනක් මා දැක නැත. නො තිබුනොත්, නො තිබෙතත්, නො තිබෙතොත් යන පද වියහරේ පවතී.
මෙහි ඇති දැරියක (දැරි අක) යන පදයේ ඇති අනුක්ත රූප ඒක වචන 'අක' ප්‍රත්‍යය දැන් බොහෝ ලේකකයන් අතින් නොලියවෙන බව පෙනේ.

අඟනක පය ගෑ ලතු සිරසෙහි　　　වැකි
මිනිසකු ගඟ දිය කෙලියෙන්　　　නොවැලකි
අනෙකක ඇස රතු විය ලතු නො ම　　　වැකි
ඇය සක එ රතට වෙන දිය　　　කරනෙකි

අඟනක ගේ, අන් එකක ගේ මවක ගේ වැනිතැනවල නම් 'අක' යෙදිය යුතු මය. සමහර අඟනෙකුගේ, එකකුගේ, මවකුගේ යනුවෙන් ලියති. -ගැහැනියක උවහොත් විලි බිය දෙක තිබිය යුතුය" යනු නිවැරදි වැකියකි. එහෙත් එය,
★ ගෑනියක් උනොත් විලි බිය දෙක තිබිය යුතුය.
★ ගෑනියෙක් උනොත් විලි බිය දෙක තිබිය යුතුය.
යනුවෙන් ලියවී ඇති තැන් ඔබ ද දැක ඇතැය් සිතමි.

# සුබස් සිතිවිලි

# මහප්එරාන වීස්සුව (මහාප්‍රාන පිස්සුව)

'ද' යන්නේ පහටිය කෑල්ල ඔසවා ලියු පොලිතිනි කඩක් පිටිපිට හරවා බැලුවිට පෙනෙන්නේ අග මුල මාරු වු 'ය' යන්නකි. එය එසේ ලිවීමේ අවශ්‍යතාව මට දැනුනේ ද, දැ, දු, දෙ, දෝ, ද්‍ය, ද්‍ර, දෘ, ද්‍යෝ යන අකුරු දුටු අවදියේ ය. දැන් මට එසේ ලිවීමේ තවත් වැදගත් හේතුවක් පෙනේ.

ක-ච-ට-ත-ප යන අගෝශාක්ශර (අඝෝෂාක්ෂර) සහ ග-ජ-ඩ-(ද)-බ යන ගෝශාක්ශර ම මහාප්‍රාන අකුරු බවට පත් කිරීමේ පහසුව ඒ අනෙක් හේතුවය්. මම මෙතැන් පටන් තිතක් යෙදු 'ය' යන්න ලියන්නේ 'ද' යන්න සඳහාය. මා යෝජනා කරන විදියේ අකුරක් අපේ යතුරු පුවරුවේ නැති වීම එයට හේතුවය්.

යු/යූ , සු/සූ , සැ/සෑ, සො/ සෝ, ස්‍ය, ස්‍යෙ, ස්‍යා/ස්‍යෝ, යන විදියටම 'යා, යැ, යු, යො, ය්‍ය, යෘ, යෲ, ය්‍යා, ය්‍යෙ, ය්‍යේ, ය්‍යො, ය්‍යෝ, යන අකුරු ලිවීමේ පහසුව සුලු පටු පහසුවක් නොවේ.

එසේ ම ක-ච-ට-ත-ප -- ග-ජ-ඩ-ය-බ යන අකුරු 10 ම තිතකින් මහප්‍රාන කල හැකිය.

ක-ච-ට-ත-ප -- ග-ජ-ඩ-ය-බ කලවිට ඛ-ඡ-ඨ-ථ-ඵ-- ඝ-ඣ-ඪ-ධ-භ යන අකුරු හෝඩියෙන් ඉවත් කල හැකි ය. ග-ජ-ඩ-ද අකුරු හැදී ඇති සැටි ගැන සිතන්න. යතුරු පුවරුටවත් යතුරු ලියන්නාටත් එවිට දැනෙන සනීපය ! සැහැල්ලුව ! පහසුව ඉක්මන/ වේගය !

'පාසල් දරුවෙක් 'භායානක' වෙනුවට 'හයානක' ත් 'ඡත්‍රය' වෙනුවට 'ජත්‍රය' ත් කියවු සැටි මට අදත් මතකය්.

කඃ චඃ ටඃ තඃ ප - ගඃ ජඃ ඩඃ යඃ බඃ යනුවෙන් මහාප්‍රාන ලියා කලාතුරකින් ලියවෙන් අන්තඃපුරය, මනඃකල්පිත වැනි වචන (දෙතිත හල් කොට) අන්තඃපුරය, මනඃකල්පිත යන විදියට ද ලිවිය හැකි ය.

අභියස, වීරෝධාර, ආභාධය/ ආභාදය, අභිමන් අධියර, පුස්ථකාලය වැනි වචන, ඇතැම් පොත් පත්වල තිබුනු අවස්ථා මට මතකය.

කුඩා පොඩි සුලු වැඩට අකමැති, එබඳු වැඩ නුරස්නා කෙනෙකු ලොකු මහ බර වැඩ බඳ ගැනීමේ දහම අනුව

_අෑත / දුර යන තේරුම ඇති "ග්‍රීක් " වචනයක් වු "ටෙල් " ත් 'සකු' වචනයක් වු 'නාට්‍ය' ත් එකතු කොට මුල් ම 'ටෙලිනාට්‍ය' හැදු එකා මොකා දැය් මට නිනව්වක් නැත. බෝඩ් ලෑල්ල - ලේක් හවිස් මන්දිරය - හය්ඩ් පාක් පිට්ටනිය, දුලදා මන්දිරය - අට මස්තානය අසා දැක ඇති ඔබට එය අරුමයක් නූනත් නිවැරදි බස් වහරට එහි ඇදයක් පෙනේ._

යමකු සකු මගද බස්වල ඇති බර හඬ (බැරැඞ්) සහිත 'මහප්එරාන' අකුරුවලට නැඹුරු වීම ගැන පුදුම විය යුතු නැත.

'මහප්ඨරාන අඑලය නිසා 'අකුර - අගල - අපල - චපල - කජ්ජ - තොටියා - මඩුව - කපුරු - මදය " යන පද උවත් කෙනෙකුට -අඛුර - අඝල - අඵල -චඵල - කජ්ඣ - තොඨියා - මඪුව - කඵුරු - මධය" යන විදියට ලියත හැකිය.

'සුබැසි සිතිවිල්ලක්' ලෙස මෙය ලිවීමට තුඩු දුන් හේතුව

35 වන පිටට

